**ජනාධිපතිවරයාගේ අරමුදල - 2018**
-----------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් සුහසාධක ගෙවීම් යටතේ සිදු කළ ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් පදනමක් හෝ ක්‍රමවේදයක් හෝ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි. | සුභසාධක ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් දැනට ක්‍රියාත්මක නොවේ. ගෙවීම් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුමැතිය ලබාදී ඇත. | විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතු වීම. |
| (ආ) | අරමුදල විසින් පවත්වාගෙන යන පොත්පත් හා ලේඛන පරීක්ෂා කිරීමේදී, එම පොත්පත් හා ලේඛන නිවැරදිව හා යාවත්කාලීනව පවත්වා ගැනීමට අපොහොසත් වූ අවස්ථා නිරීක්ෂණය විය. | අදාළ විෂයභාර නිලධාරීන් දැනුවත් කර ඇත. | විධිමත් පරිදි ගිණුම් පොත්පත් පවත්වා ගත යුතු වීම. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය ප්‍රකාරව හිමිකම නොපෑ ත්‍යාග මාස 06 ඉකුත් වීමෙන් පසුව අරමුදලට ප්‍රේෂණය කළ යුතුයි. එසේ වුවද සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ වර්ෂ 04 ක කාල පරාසය තුළ, රාජසන්තක වූ මෝටර් රථ හා වෙනත් භාණ්ඩවල වටිනාකම රු. 24,948,809 ක් හා රාජසන්තක වූ මුදල් ත්‍යාග එකතුව රු. 45,308,050 ක් අයවිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 18(3) වගන්තිය අනුව ත්‍යාග ලබා ගැනීමට මාස 06 ක් තුළ ඉදිරිපත් නොවූ විට එම ත්‍යාග විශේෂ ප්‍රවර්ධන ලොතරැයි සඳහා භාවිතා කරන බව මණ්ඩලයේ සභාපතිවරයා විසින් දන්වා ඇත. එමනිසා ත්‍යාග මුදල් ගිණුම් ගතකර නොමැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොළී ආදායම රු. 217,500,880 ක් ලෙස දක්වා තිබුණද, විගණනයේදී සිදුකළ ගණනය කිරීම් අනුව එය රු. 223,654,927 ක් වීම හේතුවෙන් පොළී ආදායම හා ලැබිය යුතු පොළී ආදායම රු. 6,154,047 ක් අඩුවෙන් දක්වා තිබුණි. එම වටිනාකම තුළ රු. 5,195 872 ක පොළී ආදායම අඩුවෙන් ගිණුම්ගත කිරීමක්, රු. 68,918 ක පොළී ආදායම වැඩියෙන් ගිණුම්ගත කිරීමක් හා රු. 1,027,093 ක හඳුනා නොගත් වෙනසක් ඇතුළත් විය. | ලංකා බැංකුව මඟින් එවන ලද ලිපියක ලැබිය යුතු පොළිය වැරදි ආකාරයට දැක්වීම නිරීක්ෂණය නොවීමෙන් මෙම මුදල අඩුවෙන් සටහන් කර ඇත. 2019 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශවල නිවැරදි වටිනාකම් දැක්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ පවත්වාගෙන යන රු. 6,000,000 ක අග්‍රිමයෙන් සමාලෝචිත වර්ෂයේ රු. 2,000,000 ක වියදම් දරා තිබුණද එය වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු. 2,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2018 වර්ෂයට අදාළ රු. 2,000,000 ක වියදම ප්‍රතිපූර්ණය කර ඇත්තේ 2019 වර්ෂයේදී බැවින් 2018.12.31 දිනට වියදමක් ලෙස ගිණුම් ගත කිරීමේ හැකියාවක් නොමැත. | සමාලෝචිත වර්ෂයට අදාළ සියළු තොරුතුරු මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කළ යුතු වීම. |

## 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ඔක්තෝබර් 01 සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල විසින් සිදු කළ එක් එක් ගෙවීම් සඳහා අරමුදලේ පාලක මණ්ඩලයේ අනුමැතිය 2019 සැප්තැම්බර් 30 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | 2018 ඔක්තෝබර් 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා සිදු කල එක් එක් ගෙවීම් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇත. 2019 ඔක්තෝබර් 18 දින පැවැත්වීමට නියමිත අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | සියළු ගෙවීම් සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1978 අංක 07 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 3(2) වගන්තිය | අරමුදලේ පාලක මණ්ඩලය සඳහා ජනාධිපතිවරයා විසින් සාමාජිකයන් දෙදෙනෙකු පත්කල යුතු වුවද, 2019 ජූලි වනවිටත් පත් කර තිබුණේ එක් සාමාජිකයෙකු පමණකි. | පාලක මණ්ඩලය සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන නියෝජිතයන් පත් කරනු ලබන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ අභිමතය පරිදිය. | පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 254,920,004 ක අතිරික්තයක් වූ අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 76,972,038 ක ඌණතාවයක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. 331,892,042 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායමේ වැඩිවීම රු. 874,575,421 ක් හෙවත් සියයට 56 ක් වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණ ද, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම්වල වැඩිවීම රු. 542,683,379 ක් විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම් සහ පොළී ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් රු .මිලියන 1,685.9 කින් හා රු .මිලියන 15.21 කින් එනම් සියයට 336 කින් හා සියයට 7.5 කින් වර්ධනය වී තිබූ අතර, වෙනත් පාර්ශ්වයන්ගෙන් දායකයන් ලැබීම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 53.7 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර , සුභසාධන කටයුතු, සංස්කෘතික කටයුතු, ආගමික කටයුතු, අධ්‍යාපනික කටයුතු ,ක්‍රීඩා හා කලා කටයුතු සහ දේශීයශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා එකතුව රු.මිලියන 1,270.72 ක් වැය කර තිබුණි. එම වටිනාකම මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස සැලකූ විට සියයට 58 ක් විය.

(ඇ) සුභසාධන කටයුතු ,ආගමික කටයුතු හා අධ්‍යාපනික කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 80 කින් ,සියයට 220 00කින් හා සියයට 143 කින් වර්ධනය වී තිබුණු අතර, වෛද්‍යාධාර, ක්‍රීඩා හා කලා කටයුතු හා ශිෂ්‍යත්ව ප්‍රදානය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 13 ක්, සියයට 90 ක් හා සියයට 63 කින් අඩු වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී හෘද සැත්කම් ,පිළිකා රෝග ,වකුගඩු රෝග ,මොළය ආශ්‍රිත රෝග සහ වෙනත් ප්‍රතිකාර සඳහා රෝගීන් 6,086 ක් සඳහා රු. මිලියන 1,149.02 ක් වැය කර තිබුණි . එය ,ඉකුත් වර්ෂයේදී රෝගීන් 8,873 ක් සඳහා වැය කර තිබූ රු. මිලියන 1,354.13 ක් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ වෛද්‍යාධාර ලැබූ රෝගීන් ප්‍රමාණය 2,787 කින් එනම් සියයට 31 කින් හා වෛද්‍යාධාර වියදම රු. මිලියන 205.11 කින් අඩුවී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,745 ක මුදලක් ආයෝජනය කර තිබූ අතර රු. මිලියන 1,543.52 ක ආයෝජන ආපසු ලබාගෙන තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයෝජන වටිනාකමෙහි රු. මිලියන 201.48 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පොළී ආදායමේ ද රු. මිලියන 15.21 ක වර්ධනයක් විය. මේ සඳහා සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ආයෝජනයන්හි පොළී ප්‍රතිශතය ඉහළයාමද බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් උසස් පෙළ හදාරන අඩු ආදායම්ලාභී සිසුන් සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී එම යෝජනා ක්‍රමය මඟින් රාජකීය නාට්‍ය හා රංග කලා ඇකඩමියේ පාඨමාලාවක් හැදෑරීම සඳහා සිසුවෙකු නොවන රංගන ශිල්පිනියකට ද රු. 500,000 ක් ලබා දී තිබුණු අතර එය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඉන් සියයට 50 ක දායකත්වය වන රු. 250,000 මහපොල උසස් අධ්‍යාපන අරමුදලින්ද ලබාගෙන තිබුණි . | 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අනුමත ක්‍රමවේද මත වියදම් දැරිය යුතු අතර නිසි පරිදි ගිණුම් ගත කළ යුතු වීම. |
| (ආ) | අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම්වලින් සියයට 50 ක් මහපොළ ශිෂ්‍යත්ව අරමුදල වෙත ගෙවන බව සමාලෝචිත වර්ෂයේ ගිණුම් ප්‍රතිපත්ති තුළ ඇතුළත් කර තිබුණද, ඊට අදාළ නීතිමය එකඟතාවයක් නොතිබුණි. | එකඟ වෙමි. | නීත්‍යානුකූල පදනමක් සකස් කර ගත යුතු වීම. |
| (ඇ) | අරමුදලේ පාලක මණ්ඩලය විසින් එක් එක් රෝග සඳහා අනුමත කර තිබූ සීමාවන් ඉක්මවා විශේෂ අනුමැතීන් මත රෝගීන් 38 දෙනෙකුට එකතුව රු. 18,730,942 ක් ගෙවා තිබුණි . එම ඉක්මවීම රෝගීන් 38 දෙනා සඳහා ගෙවා තිබුණු මුළු මුදලෙන් සියයට 63 ක් පමණ විය . | අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුමැතිය මත ගෙවීම් කර ඇත. | අනුමත සීමාවන්ට අනුකූලව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු. 161,000,000ක ණය ශේෂය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 15 ඡේදය ප්‍රකාරව ,ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල 4(v) ඡේදයේ තොරතුරු හෙළිදරව් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් වෙත ඊට අදාල සියළු තොරතුරු හෙළිදරව් කළ යුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම සඳහා රු .මිලියන 1,178.69ක් වැය කර තිබුණ අතර ,ඉන් මහජන නියෝජිතයන් ලෙස තේරීපත්ව සිටින සහ එලෙස පත් වී සිටි පුද්ගලයන් 16 දෙනෙකු වෙනුවෙන් විශේෂ අනුමැතීන් මත රු. මිලියන 7ක්ද ,සෙසු මහජනතාවගේ වෛද්‍යාධාර අවශ්‍යතා 6,070 ක් වෙනුවෙන් රු . මිලියන 1,142ක් ද වැයකර තිබුණි. තවද, පෞද්ගලික ආයතන හා රෝහල් වෙත ගෙවිය මුදල රු .මිලියන 29.67 ක් සම්බන්ධයෙන් රෝගීන් සංඛ්‍යාව හා වටිනාකම වෙන් වෙන්ව හඳුනාගත නොහැකි විය. | ජනාධිපති අරමුදලේ පාලක මණ්ඩලයේ සභාපති ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුමැතිය මත මහජන නියෝජිතයන් වෙනුවෙන් ගෙවීම් සිදු කර ඇත. බිල්පත් වටිනාකම් වෙන්කර හඳුනාගැනීමට පරිගණකය මඟින් ක්‍රමවේදයක් සකස් කරමින් පවතී. | අනුමත සීමාවන්ට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| (ඊ) | 2015 වර්ෂයේදී ඇස්බැස්ටෝස් වෙනුවට විකල්පයක් හඳුන්වාදීමට පර්යේෂණ සිදුකරනු ලබන පුද්ගලයන්ට තෑගි පිරිනැමීමට අරමුදලක් පිහිටුවීම සඳහා පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබූ රු. 100,000 ක මුදල සම්බන්ධයෙන් අදාල ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් මෙතෙක් ගෙන නොතිබුණි. | අදාළ අංශවලින් විමසා ඉදිරි කටයුතු සිදු කරමි. | අපේක්ෂිත අරමුණු කරා යොමු කළ යුතු වීම. |